# ග්‍රාමීය බැංකු අත්දැකීම් දෙකක්

## හක්මණ සහ හාරිස්පත්තුව උතුර



JANA SAVIYA

ජනසවි උත්සාහයන් අංක 3.

BKT 0155
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ග්‍රාමීය බැංකු අත්දැකීම් දෙකක්

හක්මණ හාරිස්පත්තුව
උතුර විවිධ සේවා
සමුපකාර සමිති මගින්
ජනසවිලාභීන්ට ණය දීමේ
සාර්ථක අත්දැකීම්
දෙකක් හඳුන්වාදීමක්.

ඩී.ඒ. ද සොයිසා

ප්‍රකාශනය
ජනසවි කොමසාරිස්
1990

# ස්තුතිය

හක්මණ හා හාරිස්පත්තුව ප්‍රාදේශීය කොට්ඨාශවල ජනසවිලාභීන්ගේ උත්සාහයෙන් හරියාකාරව දැක අඳුනා ගෙන එම ජනතාවගේ සැඟවී තිබුණු ජනශක්තිය ඵලදායී ව නිෂ්පාදනයට යොමු කිරීම සඳහා ග්‍රාමීය බැංකුවලින් ණය දීමේ නැවුම් ක්‍රියාවලියකට පුරෝගාමී වූ හක්මණ හා හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතිවල සියලු දෙනාටම.

මෙම සමිති දෙකේ උත්සාහය පිළිබඳ හැදෑරීමක් කළ පොල්ගොල්ලේ ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලයේ සී.ඒ. ද සොයිසා මහතාට.

පිටුපස කවරයේ ඇති විමලරත්න කුමාරගම-ගේ කවිය උපුටා ගත්තේ ඔහුගේ විචාසිතය (1948) කවි පෙළෙන්.

පොතේ නම'කුරු ඇඳ දුන් ෆීනික්ස් දැන්වීම සමාගමේ චිත්‍ර ශිල්පීන්ට

# ග්‍රාමීය බැංකු දෙකක

# අත්දැකීමක්

නැති බැරි අය ඇති හැකි අය කිරීම ජනසවිය ක්‍රියාත්මක වැඩ පිළිවෙලෙහි අරමුණ යි. එම අරමුණ ම ඉටුකර ගැනීම සඳහා ජනසවිලාභීන් වෙත පිරිනැමෙන සමුපකාර ග්‍රාමීය බැංකු ණය ක්‍රමයක් දැනටමත් ක්‍රියාත්මක වේ. ජනසවිලාභීන්ගේ ශක්තීන් හඳුනාගෙන එම හැකියාවන් තුළින් නිෂ්පාදන ශක්තිය හා ආදායම් වැඩිකර ලීමට ගත් වැදගත් ක්‍රියා මාර්ගයක් ලෙස මෙම ණය ක්‍රමය හඳුන්වා දිය හැකි ය. එමෙන් ම මෙම ණය ක්‍රමය පදනම්ව බිහිවන නිෂ්පාදන සමිතිය විසින් මිලදී ගෙන නැවත සෙසු ජනසවිලාභීන්ට හා පාරිභෝගිකයින්ට ලබාදීමට ඇති හැකියාව නිසා පාරිභෝගික අවශ්‍යතා ඉටුකරලීමට දායක වන අවස්ථාවක් ලෙස ද වැදගත් වේ.

ස්වයං රැකියා ලෙස ඇරඹූ විවිධ ව්‍යාපාතීන් සඳහා වූ ණය සැපයුම මත නිෂ්පාදන ධාරිතාවය වැඩි වීමත් සමග අළුත් රැකියා අවස්ථා ඇතිවීම ද වැදගත් ප්‍රතිඵලයකි. ජනසවි පවුල් ඒකකවල සාමාජිකයින් මෙන්ම රැකියා නොමැති තරුණ තරුණියන් සඳහා නව රැකියා අවස්ථා ඇතිවීම ඔවුන්ගේ මෙන් ම එම පවුල් වල ආදායම් වර්ධනයටත් එමගින් ජාතික සංවර්ධන කාර්‍යයටත් දායක වීමකි. අධ්‍යයනයකට ලක් වූ දැනටමත් ජනසවිය ක්‍රියාත්මක කරන විවිධ සේවා සමුපකාර සමිති දෙකක් මෙම කාර්‍යයට උරදී ඇත. එනම්: මහනුවර දිස්ත්‍රික්කයේ සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතියත්, මාතර දිස්ත්‍රික්කයේ සීමාසහිත හක්මන විවිධ සේවා සමුපකාර සමිතියත් ය.

**ජනසවිලාභීන්ගේ ඉතිරි කිරීම්.**

සෑම ජනසවිලාභියකුට ම තම මනාපය පරිදි මාසිකව රුපියල් 458/= ක් ඉතිරි කළ හැකි ය. ඉතිරි කිරීමට පෙළඹවීම සඳහා ජනසවිලාභීන් වෙත ජනසවි මුද්දර ලබාදෙනුයේ අවස්ථා දෙකකට ය.

| | | |
|---|---|---|
| රුපියල් 100/= බැගින් මුද්දර 10 ක් සඳහා | = | රු: 1000.00 |
| රුපියල් 458/= ක් වටිනා ඉතිරි කිරීම් | = | රු: 458.00 |
| වටිනාකම් එකතුව | = | රු: 1458.00 |

රුපියල් 1000/= ක වටිනාකමින් යුත් මුද්දර අදාළ සමුපකාර සමිතිය වෙත ඉදිරිපත් කිරීමෙන් පාරිභෝගික භාණ්ඩ ලබාගත හැකි ය. රු: 458/= ක් වටිනා මුද්දරය ජාතික ඉතිරි කිරීමේ බැංකුව නියෝජනය කරන තැපැල් කාර්‍යාලය වෙත භාර දී ඉතිරි කළ හැකි යි. මෙම මුදල් ජනසවිය 2 වටය ක්‍රියාත්මක කිරීමේදී සමුපකාර ග්‍රාමීය බැංකුවේ තැන්පත් කිරීමට විධිවිධාන සළසා ඇත. ජනසවිලාභියාගේ කැමැත්ත පරිදි ඉතිරි කිරීමේ වටිනාකම ජනසවිපතක් මගින් නැවත ලබාගෙන සමුපකාර සමිතිය වෙත ඉදිරිපත් කර පාරිභෝගික භාණ්ඩ ලබා ගැනිමට ද පුළුවන. මේ අනුව ඉතිරි කිරීම සඳහා අවස්ථාව ලබාදී ඇතත් ජනසවිලාභියාට හිමි රුපියල් 1458/= හි වටිනාකමට පාරි භෝගික ද්‍රව්‍ය ලබාගැනීමට අවස්ථාව ඇත. ඉතිරි කිරීම් පාරිභෝජනය සඳහා ලබා නොගන්නේ නම් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ එක්රැස් වේ. ජනසවිලාභීන්ගේ මෙම ඉතිරි කිරීම් කිසියම් ආයෝජනය කිරීමේ අවස්ථාවන්ට මග පාදමින් ජනසවිලාභී ණය ක්‍රමය හඳුන්වා දී ඇත.

**ජනසවිලාභී ණය ක්‍රමය**

ජනසවිලාභීන්ගේ ඉතිරි කිරීම් පදනම් කර ගනිමින් 'ජනසවි ලාභී ණය ක්‍රමය' ක්‍රියාත්මක වේ. විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ තැන්පත් මුදල් ණය ප්‍රදානය සඳහා උපයෝගී කර ගන්නා අතර ජනසවිලාභීන්ගේ තැන්පත් ද ඊට අයත් වේ. මෙම ණය ක්‍රමයෙහි විශේෂ ලක්‍ෂණය වන්නේ ණය ලබන්නා ජනසවිලාභියකු වීමත්, ණය හා ණය පොලී ආපසු අය කර ගැනීම සඳහා මාසික ජනසවි ඉතිරි කිරීමේ රුපියල් 458/= ක මුදල උපයෝගී කර ගැනීමත් ය. සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතිය මෙම ණය 'ජනසවි ලාභී ණය' ලෙස හඳුන්වා ඇති අතර සීමාසහිත හක්මන විවිධ සේවා සමුපකාර සමිතිය 'ජනසවි ව්‍යාපෘති ණය' ලෙස හඳුන්වා දී ඇත.

ජනසවිලාභීන් ස්වයං රැකියාවල යොමු කර නිෂ්පාදන ශක්තිය තුළින් ආදායම් තත්ත්වය වැඩි දියුණු කිරීම ණය ක්‍රමයේ මූලික පරමාර්ථය වේ. ඒ අනුව කෘෂිකර්මාන්ත, කර්මාන්ත, විවිධ සුළු කර්මාන්ත සත්ව පාලනය හා වෙළඳාම වැනි කටයුතු සඳහා ණය ප්‍රදානය කෙරේ. මීට අමතරව ජනසවිලාභී පවුල් වල නිවාස

වැඩි දියුණු කර ගැනීම සඳහා ද, සංවර්ධන ණය වශයෙන් ද ණය මුදල් ලබා දී ඇත.

**ජනසවි ධන යෝජන ණය ක්‍රමය**

ජනසවිලාභී ණය ලබාගෙන විවිධ ව්‍යාපාති ආරම්භ කර ඇතත් එම ව්‍යාපාති පවත්වාගෙන යාමට අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා ජනසවිලාභී, පවුල්වල සාමාජිකයින් වෙත ධන යෝජන ගිණුමක් මත නිකුත් කර ඇති ණය මෙම ණය ක්‍රමයට අයත් ලෙස සැලකිය හැකි ය. මුල් ණය මුදල ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, උපකරණ වැනි ප්‍රාග්ධන වියදම් දැරීමට ප්‍රමාණවත් වේ. ඉන්පසු ව්‍යාපාතින් පවත්වාගෙන යාමට හා නිෂ්පාදන කටයුතු සඳහා අමුද්‍රව්‍ය හා වෙනත් වියදම් සඳහා මුදල් අවශ්‍ය වේ. එම කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය ජනසවි ධන යෝජන ණය ක්‍රමය මගින් එම ජනසවි පවුල වෙත ලබා දෙයි. මෙම ණය ක්‍රමය දැනට සීමාසහිත හක්මන විවිධ සේවා සමුපකාර සමිතිය විසින් ක්‍රියාත්මක කර ඇත.

**සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතියේ "ජනසවිලාභී ණය" ක්‍රියාත්මක ස්වභාවය.**

ප්‍රාදේශීය ලේකම්/උප දිසාපති තුමාගේ නිර්දේශය මත ජනසවිලාභී සාමාජිකයින් වෙත ණය ඉල්ලුම් පත් නිකුත් කෙරේ. ණය ඉල්ලුම් පත් නිකුත් කිරීම බැංකු සේවා කළමණාකරුගේ අධීක්ෂණය යටතේ ප්‍රධාන කාර්‍යාලීය මට්ටමේදී සිදු වේ. සම්පූර්ණ කරන ලද ණය ඉල්ලුම් පත් අදාළ ග්‍රාමීය බැංකු ශාඛා මගින් ප්‍රධාන කාර්‍යාලය වෙත ලැබෙන අතර එහිදී පරීක්ෂාවට භාජන කෙරේ. ග්‍රාම සේවා නිලධාරී, ජනසවි සහායක කණ්ඩායම් සමඟ බැංකු සේවා කළමනාකරු ණය දීමට පෙර විපරම් කිරීමේ කටයුතු අවසන් කිරීමෙන් පසු ණය අනු කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ. එහි නිර්දේශයන් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසු ණය මුදල් මුදා හැරේ. මෙම ක්‍රියාවලිය තුළින් ණය ඉල්ලුම් පතක් ලැබී මසක් පමණ කාලයකදී ණය මුදල් ලබාදීම සිදු වේ.

ජනසවිලාභීන් සඳහා දෙනු ලබන ණය මුදලේ උපරිමය රුපියල් 10,000/= කි. මේ සඳහා අය කෙරෙනුයේ සියයට 18 ක වාර්ෂික පොලියකි. ප්‍රදේශයේ ජනසවිලාභීන් වෙත ණය මුදල් ප්‍රදානය කරනු ලබන ආයතනවලින් ද අය කෙරෙනුයේ ද, සියයට 18 ක වාර්ෂික පොලියකි. දැනට සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛාවලින් නිකුත් කරනු ලබන ණය සඳහා සියයට 22 ක වාර්ෂික

පොලියක් අය කෙරේ. මේ අනුව ජනසවිලාභීන් සඳහා සියයට 4 ක වාර්ෂික පොලී ප්‍රතිශත සහනයක් ලැබී ඇති බව පෙනේ. ඉතිරි කිරීම් සඳහා සියයට 11 ක වාර්ෂික පොලියක් ගෙවීම් කෙරේ.

1990 සැප්තැම්බර් මාසය අවසානයට සමුපකාර සමිතියත් ණය දෙන අනෙකුත් ආයතනත් ජනසවි ලාභීන් වෙත ලබා දී ඇති ණය පිළිබඳ විස්තරයක් පහත දැක් වේ.

| ආයතනය | ණය සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| විවිධ සේවා සමිතියෙන් | 294 | 70.3 |
| මහජන බැංකුව | 84 | 20.1 |
| ලංකා බැංකුව | 25 | 6.0 |
| ග්‍රාමීය සංවර්ධන බැංකුව | 13 | 3.1 |
| වාණිජ බැංකුව | 02 | 0.5 |
| එකතුව | 418 | 100 |

ණය ලාභීන්ගේ දක්ෂතාවයන් සැළකිල්ලට ගනිමින් ස්වයං රැකියා සඳහා ණය නිකුත් කෙරේ. මෙහිදී විශේෂ අවධානය යොමු වී ඇත්තේ කාර්මික සංවර්ධන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පශු සම්පත් මණ්ඩලය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය වැනි ආයතන මගින් විවිධ පුහුණුවීම් ලබා දී ඇති අය වෙත ව්‍යාපාති ණය ලබා දීම යි. එමෙන් ම විවිධ ව්‍යාපාතීන් පවත්වා ගෙන ගිය ජනසවිලාභීන්ට ද තම ව්‍යාපාති වැඩි දියුණු කර ගැනීම සඳහා ණය මුදල් ලබා දී ඇත. තවද නිවාස අළුත්වැඩියා හා වැඩි දියුණු කිරීමට සංවර්ධන ණය ලබා දී ඇත.

**දුන් ණය විග්‍රහය.**

සමිතියට අනුයුක්ත ජනසවි පවුල් එක්ක සංඛ්‍යාව 4005 කි. ජනසවිලාභී ණය ක්‍රමය 1990 පෙබරවාරි මස 26 වැනි දින තීරණය පරිදි ක්‍රියාත්මක වී 1990 මාර්තු 20 වන දින ආරම්භ වී ඇත. මෙදින ප්‍රථමයෙන් ම ජනසවිලාභීන් 10 දෙනෙකුට රුපියල් 62150/= ක් වටිනා මහන මැෂින් ලබා දී ඇත. 1990 ඔක්තෝබර් මස අවසානයට ජනසවිලාභීන් 400 කට ණය ප්‍රදානය කර ඇත. ජනසවි ලාභී සංඛ්‍යාව අනුව සියයට 10 ක ප්‍රමාණයට ණය සැපයීම කර ඇත. ලබා දී ඇති ණය මුදල රුපියල් 1942555.75 කි. ණය මුදල් පිළිබඳ විග්‍රහය පහත සඳහන් වේ.

සීමාසහිත හරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතිය
1990 ඔක්තෝබර් මස අවසනට ජනසවි ලාභී ණය ප්‍රදානය

| කාරණය | ණය ගණන | ප්‍රතිශතය | ණය මුදල රුපියල් | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1. කෘෂිකර්මය/ සත්ව පාලනය | 130 | 32.5 | 637000.00 | 33 |
| 2. වෙළඳාම | 76 | 19.0 | 365500.00 | 19 |
| 3. ස්වයං රැකියා (මහන මැෂින්) | 50 | 12.5 | 280880.00 | 14 |
| 4. සංවර්ධන ණය (නිවාස) | 46 | 11.5 | 196435.75 | 10 |
| 5. සුළු නිෂ්පාදන/ කර්මාන්ත | 67 | 16.75 | 311500.00 | 16 |
| 6. ස්වයං රැකියා (විවිධ) | 31 | 7.75 | 151240.00 | 8 |
| එකතුව | 400 | 100 | 1942555.75 | 100 |

සමිති නිලධාරීන්ගෙන් ලබාගත් තොරතුරු අනුව සියයට 90 ක් පමණ නව ව්‍යාපාති ආරම්භ කර ඇත. ණය විග්‍රහය අනුව ජනසවිලාභීන්ගේ ආදායම් තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු වී ඇත. මුළු ණය සංඛ්‍යාව වන 400 න් ණය 354 ක් යොමු වී ඇත්තේ ආදායම් වැඩි කිරීම සඳහා ය. මෙය ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේදී සියයට 88.5 ක ප්‍රමාණයකි. මුළු ණය මුදල රුපියල් 1942555.75 න් රුපියල් 1746120.00 ක් ආදායම් වර්ධනය සඳහා ප්‍රදානය කර ඇති අතර ප්‍රතිශතයක් වශයෙන් ගත් කල සියයට 89.8 කි.

**ණය ආපසු අයවීම.**

1990 ඔක්තෝබර් මස අවසානයට දී ඇති ණය මුදලින් අයවී ඇති ප්‍රමාණය රුපියල් 439314.35 කි. ණය ක්‍රමය ආරම්භ වූ 1990 මාර්තු මස සිට මාස 8 ක කාල සීමාවකදී අයවී ඇති ණය ප්‍රමාණය දී ඇති ණය ප්‍රමාණය මත ප්‍රතිශතය සියයට 22.6 කි. මේ අනුව ණය මුදල ආපසු අයකර ගැනීම ජනසවි ඉතිරි කිරීමේ පත්

මගින් සිදුවීම සාර්ථක ණය අයවීමේ ක්‍රමයක් ලෙස වැදගත් වේ. ඉතිරි කිරීමේ ජනසවි පත් ලබා ගැනීමේදි ප්‍රායෝගික තත්ත්වයන් හැරුනු විට ණය මුදල් කල්පසු වීමේ කිසිදු අවදානමක් නොමැත. ඉදිරි කාලයේදි ජනසවි ඉතිරි කිරීම් සමුපකාර ග්‍රාමීය බැංකු මගින් සිදු කරන බැවින් ණය අය වීමේ සුළු ප්‍රමාදයන් ද මගහැරී යනු ඇත.

**නිෂ්පාදන ශක්තිය නැංවීම.**

සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතිය ප්‍රදානය කළ ජනසවිලාභි ණය තුළින් ජනසවිලාභීන්ගේ නිෂ්පාදන ශක්තිය නැංවීමෙහි ලා දායකත්වය විමසීමට ලක් කළ හැකි ය.

සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකර සමිතිය
1990 ඔක්තෝබර් මස අවසනට ජනසවි ලාභි ණය ක්‍රමය
නිශ්පාදන ශක්තිය නැංවීමේ දායකත්වය.

| ණය කාරණය | ණය සංඛ්‍යාව | | මුදල | |
|---|---|---|---|---|
| | නිශ්-පාදන | වෙනත් | නිශ්පාදන රු: ශත | වෙනත් රු: ශත |
| 1. කෘෂිකම්/ සත්ව පාලනය | 130 | - | 637000.00 | |
| 2. වෙළදාම | - | 76- | | 365500.00 |
| 3. සුළු නිෂ්පාදන/ කර්මාන්ත | 67 | - | 311500.00 | - |
| 4. ස්වයං රැකියා (මහන මැෂින්) | - | 50- | | 280880.00 |
| 5. සංවර්ධන ණය (නිවාස) | - | 46- | | 196435.75 |
| 6. ස්වයං රැකියා (විවිධ) | - | 31- | | 151240.00 |
| එකතුව | 197 | 203 | 948500.00 | 994055.00 |

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජනසවිලාභීන්ගේ නිෂ්පාදන ශක්තිය වැඩි දියුණු කිරීමෙහිලා ග්‍රාමීය බැංකු ණය ප්‍රදානයන් විග්‍රහ කිරීමේදී දුන් ණය සංඛ්‍යාව සියයට 49.3 ක ප්‍රමාණයක් ද ණය මුදල අනුව සියයට 48.8 ක ප්‍රමාණයක් ද දයක වී ඇති බව පැහැදිලි වේ.

**ජනසවි නිෂ්පාදන සඳහා අලෙවි පහසුකම්**

සමුපකාර සමිතිය විසින් ජනසවි ලාභීන්ගේ නිෂ්පාදන අලෙවි කර දීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට ඉදිරිපත් වී ඇත. නිෂ්පාදිත කොසු, ඉදල්, තේ කුඩු පැකට්, බීඩි, සබන්, බිත්තර, කුකුළු මස්, අත් යන්ත්‍ර රෙදි, ළමා ඇඳුම්, පැණි, හකුරු, දැනටමත් ප්‍රාදේශික මගින් මිලදී ගෙන අලෙවි කෙරේ.

**සීමාසහිත හක්මන විවිධ සේවා සමුපකාර සමිතියේ "ජනසවි ව්‍යාපෘති සහ ජනසවි ධන යෝජන ණය" ක්‍රමය**

සමිතියේ ජනසවි ණය ක්‍රම ආරම්භ කිරීමට පෙර පුද්ගලික ඇප මත රුපියල් 5000/= දක්වා උපරිමයකට යටත්ව ණය ප්‍රදානය කරන ලදි. ජනසවිය ක්‍රියාත්මක වීමෙන් පසු ජනසවි ලාභීන් වෙත ණය ප්‍රදානය කිරීම සඳහා එම සීමාව රුපියල් 10000/= දක්වා වැඩි කරණ ලෙස මාණ්ඩලික පත්‍රයක් මගින් කරන ලද ඉල්ලීම ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මහා සභාවේ අනුමත විය. මේ අනුව 1990 අප්‍රියෙල් මස 28 දින ජනසවිලාභීන් සිය දෙනෙකුට ණය ප්‍රදානය කිරීම සමගම සමිතියේ මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක විය. සමිතියේ ග්‍රාමීය බැංකු අටෙන් පහක් මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා දයක වී ඇත.

**ණය ක්‍රම ක්‍රියාත්මක වන ආකාරය.**

ණය ලාභීන් සඳහා පිළියෙළ කර ඇති විශේෂ ඉල්ලුම් පත්‍රය ග්‍රාමීය බැංකු ශාඛා මගින් ලබාගත හැකි වේ. මේ සඳහා ජනසවි ඉතිරි කිරීම් පොත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු වේ. ණය අපේක්ෂිත ජනසවිලාභි සාමාජිකයා විසින් ග්‍රාමීය බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කළ යුතු වේ. මේ සඳහා අවම තැන්පත් මුදල රුපියල් 25/= කි. ධන යෝජන ණය සඳහා ජනසවිලාභියා හෝ පවුලේ සාමාජිකයා නොකඩවා හය මසක්වත් ධන යෝජන ගිණුමක මුදල් තැන්පත් කර තිබිය යුතු වේ. ග්‍රාමීය බැංකු ශාඛා වෙත ඉදිරිපත් වන ණය ඉල්ලුම් පත් ග්‍රාමීය බැංකු කළමනාකරුගේ පරීක්ෂාවෙන් පසු ප්‍රධාන කාර්‍ය්‍යාලයේ බැංකු සේවා කළමනාකරු වෙත ඉදිරිපත් වේ. ඉන් අනතුරුව පෙර විපරම් කටයුතු සඳහා අදල ක්ෂේත්‍ර නිලධාරි

මහතා වෙත යොමු වේ. ඔහුගේ වාර්තාව සමඟ නැවත කාර්යාලය වෙත යොමු කිරීමෙන් පසු කොටස් මුදල් සාමාජිකත්වය ඇපකරුවන් පරීක්ෂා කර ණය අනු කමිටුව වෙත ඉදිරිපත් වේ. එහි නිර්දේශය සමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු ණය මුදල් මුද හරිනු ලැබේ. ණය ඉල්ලුම් පතක් ලැබී සති දෙකක් ඇතුළත ණය මුදල් මුද හැරීමට හැකි වීම ණය කාර්යක්ෂමතාව මෙන්ම විශේෂ අවස්ථාවක් ලෙස සඳහන් කළ යුතු වේ.

**ණය ප්‍රදානය.**

1990 ඔක්තෝබර් මස අවසානයට මාස හතක පමණ කාලයක් තුළදී ප්‍රදානය කළ 'ජනසවි ව්‍යාපෘති හා ජනසවි ධනයෝජන ණය' මුදල් ප්‍රමාණය පහත සඳහන් වේ.

දීමාසහිත හක්මන විවිධ සේවා සමුපකාර සමිතිය
1990 ඔක්තෝබර් මස අවසානයට ජනසවි ණය ප්‍රදානය.

| කාරණය | ප්‍රමාණය | ප්‍රති ශතයය | මුදල රුපියල් | ප්‍රති ශතය |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදන/සුළු කර්මාන්ත | 365 | 20 | 3168500 | 22 |
| 2. වෙළඳාම | 409 | 23 | 2911750 | 21 |
| 3. ස්වයං රැකියා | 22 | 01 | 177500 | 01 |
| 4. කෘෂිකර්ම - සත්ව පාලනය | 187 | 10 | 1187500 | 09 |
| 5. මහන මැෂින් | 522 | 29 | 3855750 | 27 |
| 6. සංවර්ධන (නිවාස) | 303 | 17 | 2870000 | 20 |
| එකතුව | 1808 | 100 | 14171000 | 100 |

**ආදායම් සහිත ණය ප්‍රමාණය**

ජනසවිලාභීන් වෙත ප්‍රදානය කර ඇති ණය සංඛ්‍යාවෙන් 983 ක් ආදායම් සහිත ණය වේ. මුළු ණය ගණන මත ප්‍රතිශතය සියයට 54.4 කි. මුළු ණය මුදලින් රුපියල් 7445250/= ක් වූ ආදායම් සහිත

ණය ප්‍රතිශතය සියයට 52.5 කි. මේ අනුව සියයට 50 කට අධික ප්‍රමාණයක් ආදායම් සහිත කටයුතු සඳහා ජනසවිලාභීන් වෙත ණය ප්‍රදානය කිරීමට සමිතියට හැකි වී ඇත.

**ජනසවි ණය තුළින් නිෂ්පාදන හැකියාව.**

ජනසවිලාභීන් නිෂ්පාදන ශක්තීන් හඳුනාගෙන ව්‍යාපෘති ණය නිකුත් කිරීමේදී ණය සංඛ්‍යාව හා මුදල මත දායකත්වය පහත සඳහන් අයුරින් දැක්විය හැක.

සිමාසහිත හක්මන විවිධ සේවා සමුපකාර සමිතිය
1990 ඔක්තෝබර් මස අවසනට ජනසවි ණය ක්‍රමය
නිශ්පාදන ශක්තීන් වර්ධනය කිරීමේ දායකත්වය.

| ණය කාරණය | ණය ගණන | | ණය මුදල (රුපියල්) | |
|---|---|---|---|---|
| | නිශ්පාදන | වෙනත් | නිශ්පාදන | වෙනත් |
| 1. නිෂ්පාදන/ සුළු කර්මාන්ත | 365 | | ·3168500 | |
| 2. වෙළඳාම | - | 409- | | 2911750 |
| 3. ස්වයං රැකියා | - | 22- | | 177500 |
| 4. කෘෂිකර්ම/ සත්ව පාලනය | 187 | - | 1187500 | - |
| 5. මහන මැෂින් | - | 522- | | 3855750 |
| 6. සංවර්ධන (නිවාස) | - | 303- | | 2870000 |
| එකතුව | 522 | 1256 | 4356000 | 9815000 |

**ණය ප්‍රදානය**

.1990 ඔක්තෝබර් මස අවසානයට මාස හතක පමණ කාලයක් තුළදී ප්‍රදානය කළ 'ජනසවි ව්‍යාපෘති හා ජනසවි ධනයෝජන ණය' මුදල් ප්‍රමාණය පහත සඳහන් වේ.

මුළු ණය සංඛ්‍යාව මත නිෂ්පාදනය වැඩි කිරීමෙහිලා දායක වූ ණය සංඛ්‍යාව 552 ක් වන අතර එහි ප්‍රතිශතය සියයට 30.5 කි. ණය මුදල් ප්‍රමාණය අනුව ප්‍රතිශතය සියයට 30.7 කි. ප්‍රදානය කළ ණය මුදල් මත මදුරු දැල්, බීඩි, පැණි, හකුරු, සකස් කළ ඇඳුම්, ගම්මිරිස් වගාව, කෙසෙල් වගාව, පනිට්ටු, ගඩොල්, රබර් බුෂ්, එන්ජින් මවුන්ට්, බේකරි, රෙදි මුද්‍රණය, වඩු, සබන්, කඩදාසි, බෑග්, යකඩ පුටු, ඉදිකොළ නිෂ්පාදන, හඳුන් කූරු, බිත්තර, කුකුළු මස්, එළවළු, කොප්පරා, වළං, මල් පෝච්චි, ඉදල්, කොසු, සපත්තු, වැනි නිෂ්පාදන හා කර්මාන්ත ආරම්භ කර ඇත. මින් සියයට 95 ක් පමණ නව ව්‍යාපාති වන අතර ඉතිරි ප්‍රමාණය කලින් පවත්වාගෙන ගිය ව්‍යාපාතිය වැඩි දියුණු කිරිම් ය.

**නිෂ්පාදන හැකියාව වර්ධනයට අමතර ණය.**

ජනසවිලාහින් වෙත ප්‍රදානය කරනු ලබන 'ජනසවි ව්‍යාපාති ණය' නිෂ්පාදන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී එම ජනසවි පවුල් ඒකකයේ සාමාජිකයකු වෙත ධනයෝජන ගිණුම මත තවත් රුපියල් 10,000/= ක උපරිමයකට යටත්ව අතිරේක ණය මුදල් ලබා දිමේ ක්‍රමයක් ද මෙම සමිතිය ක්‍රියාත්මක කර ඇත. 'ජනසවි ධන යෝජන ණය ක්‍රමය' ලෙස මීට පෙර ද විස්තර දක්වා ඇත. මෙම ණය ප්‍රදානය කිරීමේ අරමුණ වන්නේ විවිධ නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා දායක වීම ය. අතිරේක ණය ප්‍රදානය තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ රැඳී සිටින් ආදායම් වැඩි කර ගැනිමට හැකි වී ඇත. මෙම ක්‍රියා මාර්ගය මත ණය ප්‍රදානයේදී විශේෂයෙන් සළකා බලනුයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාතියේ ආර්ථික ශක්‍යතාවයයි. මේ යටතේ සපත්තු, පනිට්ටු, රබර් මෙට්ට, රබර් බුෂ් සහ ඇන්ජින් මවුන්ට්, සහ සබන් යන කර්මාන්ත දිරිමත් කර ඇත. ජනසවිලාභි පවුල් ඒකකයන්ට රුපියල් 10000/= බැගින් රුපියල් 50000/= ක් ලබා දී ඇත.

**ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය**

ජනසවිලාහින් වෙත ලබා දි ඇති ණය මුදලින් 1990 ඔක්තෝබර් මස අවසානයට අයවී ඇති ණය ප්‍රමාණය රුපියල් 2968827.00 කි. ප්‍රදානය කළ මුළු ණය මුදල් ප්‍රමාණය මත අයවූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස සියයට 21 කි. හඳුනා ගත් සාර්ථක ව්‍යාපාති සඳහා අතිරේක ණය මුදල් ප්‍රදානයේදී ආපසු ගෙවීම පිළිබඳව සැහිමකට පත්වන්නේ ආර්ථික ශක්‍යතාවය මත ය. මෙවැනි ව්‍යාපාති පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරී මහතුන් නිතර අධීක්ෂණය කරනු ලැබේ.

## රැකියා අවස්ථා ඇති වීම.

ව්‍යාපාති ණය හා ධනයෝජන ණය ක්‍රමයන් තුළින් නව රැකියා අවස්ථා බිහි වී ඇත. මෙම තත්ත්වය ඉතා වැදගත් ප්‍රතිඵලයක් ලෙස හඳුන්වා දිය හැක. විස්තර ලබාගත් ව්‍යාපාතින් කිහිපයක නව රැකියා අවස්ථා බිහිවීම පිළිබඳ තොරතුරු මෙසේ ය:

සීමාසහිත හක්මන විවිධ සේවා සමුපකාර සමිතිය
ජනසවි ව්‍යාපාති යටතේ නව රැකියා විස්තරය.

| ව්‍යාපාතිය | ජනසවි ලාභියා ඇතුළු පවුලේ අය | වෙනත් අය | එකතුව |
|---|---|---|---|
| සපත්තු නිෂ්පාදනය | 04 | 05 | 09 |
| පනිට්ටු නිෂ්පාදනය | 03 | 04 | 07 |
| රබර් බුෂ්/ ඇන්පින් මවුන්ට් | 01 | 05 | 06 |
| රබර් මෙට්ට | 05 | - | 05 |
| එකතුව | 13 | 14 | 27 |

## සාමූහික ව්‍යාපාති.

සමිති බල ප්‍රදේශයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නිල ඇඳුම් සැකසීම සඳහා ව්‍යාපාතියක් ඇරඹීමට විධිවිධාන යොද ඇත. මේ සඳහා එක් කණ්ඩායමකට පස්දෙනා බැගින් කණ්ඩායම් පහක් සඳහා දැනටමත් මහන මැෂින් ලබා දී ඇත. මැෂින් ලබා දී ඇත්තේ ජනසවි ව්‍යාපාති ණය ක්‍රමය යටතේය. දැනට අවශ්‍ය රෙදි ලබාගැනීමේ ප්‍රමාදයක් නිසා ව්‍යාපාතියේ කටයුතු ඇරඹීම ප්‍රමාද වී ඇත. විශේෂයෙන් මෙම ව්‍යාපාතියේ සාමූහික පදනමක් මත ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. එතෙක් ණය ලාභීන් පෞද්ගලිකව ඇඳුම් මැහීමේ කටයුතුවල නිරත වී සිටී.

**ණය සඳහා පොලිය.**

ජනසවිලාභීන්ට සහනයක් වශයෙන් මෙම ණය සඳහා විශේෂ පොලී අඩු කිරීමක් වෙනත් ණය පොලී අනුපාතයන් හා සැසඳීමේදී දක්නට ලැබේ. ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය සියයට 16 කි. වෙනත් සියළුම බැංකු මගින් ජනසවිලාභීන් වෙත ප්‍රදානය කරනු ලබන ණය සඳහා පොලී ප්‍රතිශතය සියයට 18 කි.

**නිෂ්පාදන අලෙවි පහසුකම්.**

සමිතියේ ප්‍රාදේශික මගින් මුදලට හා ජනසවි මුද්දරවලට ජනසවිලාභී නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. දැනටමත් බිත්තර, කොසු, ඉදල්, කොහු ලණු, රබර් මෙට්ට, පනිට්ටු, ලියුම් කවර, කඩදාසි බෑග්, පැකට් කළ භාණ්ඩ, හඳුන්කූරු, අත් යන්ත්‍ර, රෙදි, මදුරු දැල්, කොපි පොත් හා සබන්, අලෙවි කෙරේ. ජනසවි ලාභීන්ගේ නිෂ්පාදන භාණ්ඩ මිල දී ගැනීම සඳහාත්, අතිරික්ත නිෂ්පාදන බල ප්‍රදේශයෙන් බැහැරව අලෙවි කිරීම සඳහාත්, අලෙවි කළමණාකාර මහතෙක් ද පත්කර ඇත.

**මිල දී ගැනීමේ මධ්‍යස්ථාන.**

ජනසවිලාභීන්ගේ නිෂ්පාදනයන් වක්‍රස්කර අලෙවි කිරීම සඳහා මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩ පිළිවෙලක් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී. මේ අනුව සීමාසහිත හාරිස්පත්තුව උතුර හා හක්මන විවිධ සේවා සමුපකාර සමිති විසින් ද එම මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීමට උනන්දු වී ඇත.

මෙම මධ්‍යස්ථාන පිහිටුවීමෙන් පසු අලෙවි ගැටලු බොහෝ දුරට මගහරවා ගැනීමට හැකි වේ යයි අපේක්ෂා කෙරේ. මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ජනසවිලාභීන්ගේ සියළුම නිෂ්පාදන මිල දී ගෙන සමිති බල ප්‍රදේශයේ මෙන් ම ඉන් බැහැරත් අලෙවි කිරීමට බලාපොරොත්තු වන බැවින් එවැනි කාර්‍ය්‍යයක් තුළින් ජනසවි ලාභී නිෂ්පාදකයා ත්, පාරිභෝගිකයාත් අතරමැදියාගේ ග්‍රහණයෙන් මුදවා ගැනීමට හැකි වීම නිෂ්පාදකයාට ධෛර්‍ය්‍යදීමකි. පාරිභෝගිකයාට සහනයකි. ජනසවිලාභී ණය ක්‍රමය තුළින් නිෂ්පාදන ශක්තිය හා ධාරිතාව වර්ධනය කළ හැකි වුවත්, නිෂ්පාදනයේ දීර්ඝකාලීන රැදී සිටිය හැක්කේ අලෙවි ගැටලු විසඳ ගැනීම තුළින් පමණි.

**ජනසවිලාභී ණය ලබාගැනීමට නම්.**

1. විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජිකත්වය ලබාගත යුතු වේ.
2. ජනසවිලාභියෙක් හෝ ජනසවි පවුලේ සාමාජිකයෙක් විය යුතු ය.
3. ණය ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතු අතර ජනසවිලාභී හෝ සාමාජිකයින් දෙදෙනකු ණය වෙනුවෙන් ඇප විය යුතුය.
4. කිසියම් වෘත්තිය දක්ෂතාවක් හෝ පුහුණුවක් ලබා තිබීම විශේෂිත වේ.
5. සමිතිය අපේක්ෂා කරන්නේ නම් ණය මුදල හා අදාළ කොටස් වටිනාකම හෝ සුරැකුම් තැන්පත් අවශ්‍ය ය.
6. අවශ්‍ය නම් උප දිසාපති/ප්‍රාදේශික ලේකම් හෝ නිර්දේශ ලබාගත යුතු ය.
7. ඉතිරි කිරීමේ ගිණුමක් හා අවශ්‍ය නම් ධන යෝජන ගිණුමක නොකඩවා මුදල් තැන්පත් කළ යුතු වේ.

**ජනසවි ණය ප්‍රදානය කළ හැක්කේ.**

1. ස්වයං රැකියා හා නව ව්‍යාපාති ඇරඹීමට.
2. පවත්වාගෙන යන ව්‍යාපාති වැඩි දියුණු කිරීමට.
3. සාමූහිකව විවිධ ව්‍යාපාරයන් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාමට.
4. නිවාස තැනීම, අලුත්වැඩියා කිරීම, විදුලිය ලබාගැනීම වැනි සංවර්ධන කටයුතුසඳහා.

**ණය මුදා හැරීමේ කොන්දේසි.**

ණය මුදා හැරීමේ දී කොන්දේසි වශයෙන් පහත සඳහන් කරුණු සැළකිල්ලට ගනී.

1. සංවර්ධන කටයුතු සඳහා ණය නිකුත් කරනුයේ අවශ්‍යතාව පදනම් කර ගනිමින් ද්‍රව්‍ය සැපයීමෙනි. බිත්ති ගොඩ නැගීමේදී ගඩොල්, වැලි, සිමෙන්ති වැනි ද්‍රව්‍ය සැපයීම, වහල සකස් කිරීමේදී ලී සහ උළු සැපයීම කළ හැක.

2. ස්වයං රැකියා සඳහා අවශ්‍ය අවස්ථාවලදී යන්ත්‍ර සූත්‍ර උපකරණ, පාපැදි, මහන මැෂින් වැනි දේ සැපයීම තුළින් ණය ප්‍රදානය.

3. මුදලින් ලබා දිය යුතු ණය ව්‍යාපාර ස්වභාවය අනුව වාරික වශයෙන් නිදහස් කිරීම.

**විශේෂ කරුණු.**

ජනසවිලාභී කාර්ය සාධනය උදෙසා ණය ප්‍රදානය, අළෙවි ගැටලු විසඳීම පමණක් ප්‍රමාණවත් නොවේ. තව දුරටත්සංවර්ධනය කළ යුතු අවස්ථා කිහිපයක් මෙහිදී සිහිපත් කිරීම වැදගත් වේ.

1. ජනසවි ලාභියාගේ සංවර්ධනය යනු ආර්ථික සමෘද්ධිය පමණක් නොවේ. ඔහුගේ සමාජීය හා සංස්කෘතික දියුණුව උදෙසා කටයුතු කිරීම.

2. ජනසවිලාභීන්ට විශේෂයෙන්ම ආදායම් වර්ධනය සමග සක සුරුවම්කම හුරු කිරීම - ඉතිරි කිරීමට පෙළඹවීම.

3. ස්වකීය ව්‍යාපාර පවත්වාගෙන යාමේදී වැදගත්වන ගිණුම් තැබීම, කළමණාකරණය වැනි අංශ පිළිබඳව පුහුණුව ලබා දීම.

4. සමුපකාර සමිතියේ සමාජිකයකු බැවින් ඔහු සමුපකාරිකයකු ලෙස වර්ධනය කිරීම තුළින් යහපත් පුරවැසියකු කිරීම.

ජනසවිලාභීන්ගේ සංවර්ධනය උදෙසා ග්‍රාමීය බැංකු ණය ක්‍රමය පමණක් උපයෝගී කර ගැනීම ප්‍රමාණවත් ක්‍රියා මාර්ගයක් නොවේ. සමස්ත සංවර්ධනය උදෙසා සමුපකාර ක්‍රමය අත්වැලක් බවට පත්වීම අවශ්‍ය වේ. එය ජාතික සංවර්ධනය ට දායක වීමේ කාර්යයක් ලෙස ද අවධානය යොමු විය යුතු ය.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය